කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර) -2016

2022 - මැයි

**BCOM E 2055 - සාර්ව ආර්ථික විද්‍යාව**

ප්‍රශ්න සංඛ්‍යාව : (හයයි) 06

ඕනෑම ප්‍රශ්න පහකට (05) කට පිළිතුරු සපයන්න. කාලය : පැය 03 යි

---

**ප්‍රශ්ණ අංක 01**

අ. සූක්ෂ්ම ආර්ථික විද්‍යාව සහ සාර්ව ආර්ථික විද්‍යාව අතර සම්බන්ධය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. i. " මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ (GDP) වැඩිවීම බොහෝ විට අර්ථකථනය කරනු ලබන්නේ සුබසාධනයේ වැඩිවීමක් ලෙසය. මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වෙද? පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii දළ දේශීය නිෂ්පාදිතය (GDP) සහ දළ ජාතික නිෂ්පාදිතය (GNP) අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ. "ආර්ථිකයේ සාර්ව ආර්ථික ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා සාර්ව ආර්ථික න්‍යාය අධ්‍යයනය කිරීම වැදගත් වේ". සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 02**

අ. i. අංශ හතරක ආකෘතියක් තුළ ආදායම් සහ වියදම් චක්‍රිය ප්‍රවාහය ප්‍රස්ථාරිකව නිරූපණය කර, විස්තර කරන්න.

(ලකුණු 05)

ii. ආර්ථිකයක ආදායම් සහ වියදම් ප්‍රවාහයට ගලාඒම් (injections) සහ ගලායාම් (outflow) බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. උපකල්පිත ආර්ථිකයක් සමතුලිතව පවතී යැයි සිතන්න,

$Y = C+I+G+(X-M)$

$C = 300+0.80(Y-T)$

I (ආයෝජන) = 400

G (රජයේ වියදම්) = 300

X (අපනයනය) = 200

M (ආනයන) =30+0.1Y

T (බදු) = 70

සියලුම සංඛ්‍යා රුපියල් මිලියන වලින්

i. ජාතික ආදායම සමතුලිතය ගණනය කරන්න

(ලකුණු 04)

ii සමතුලිත ආදායමේදී පරිභෝජනය ගණනය කරන්න

(ලකුණු 03)

iii ජාතික ආදායමේ සමතුලිතතා මට්ටම රුපියල් මිලියන 40 කින් වැඩි කිරීමට කොපමණ අමතර රජයේ වියදම් අවශ්‍ය වේද ?

(ලකුණු 03)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 03**

අ. පොලී අනුපාතය සහ ආදායම අතර සම්බන්ධය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. i. "IS-LM ආකෘතිය තුල පොදු සමතුලිතතාවයට පැමිණීම සඳහා භාණ්ඩ සහ මුදල් වෙළඳපොළ, දෙකෙහිම සමතුලිතතා තත්ත්වයන් ඒකාබද්ධ කරයි". සාකච්ඡා කරන්න

(ලකුණු 05)

ii. සෘජු බදු සහ රජයේ වියදම් IS වක්‍රයට බලපාන ආකාරය විස්තර කරන්න?

(ලකුණු 05)

ඇ. ශ්‍රී ලංකා ආර්ථිකයේ කොවිඩ් -19 හි සෘණාත්මක බලපෑම අවම කිරීම සඳහා සාර්ව ආර්ථික ප්‍රතිපත්ති භාවිතා කරන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 04

අ. "අයවැය යනු මුදල් වර්ෂය සඳහා රජයේ අපේක්ෂිත ලැබීම් සහ අපේක්ෂිත වියදම් පිළිබඳ ප්‍රකාශයකි".

i. "සමතුලිත අයවැය රටක සමස්ත ඉල්ලුම් (AD) මට්ටම ඉහළ නංවයි". සාකච්ඡා කරන්න

(ලකුණු 05)

ii. ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රශ්න අවම කිරීම සඳහා අයවැය ප්‍රතිපත්ති භාවිතා කළ හැක්කේ කෙසේද?

(ලකුණු 05)

ආ. i. ශ්‍රී ලංකා රජය විසින් නම්‍යශීලී විනිමය අනුපාත ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත. ශ්‍රී ලංකා ආර්ථිකයට එහි බලපෑම සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

ii. විනිමය අනුපාතයට බලපාන සාධක මොනවාද?

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 05

අ. "උද්ධමනය යනු රටක සාමාන්‍ය මිල මට්ටමේ අඛණ්ඩ සහ සැලකිය යුතු ඉහල යාමකි".

i. රටක ආර්ථික සංවර්ධනයට උද්ධමනය මගින් ඇති කරන බලපෑම විවේචනාත්මකව විමසා බලන්න

(ලකුණු 05)

ii "උද්ධමනය යනු භාණ්ඩ හා සේවා ඉල්ලුමේ සහ සැපයුමේ අසමතුලිතතාවයේ ප්‍රතිඵලයකි". ඔබ එකඟද? පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ A.W පිලිප්ස් විසින් උද්ධමන අනුපාතය සහ විරැකියා අනුපාතය අතර ඇති ප්‍රතිලෝම සම්බන්ධය සොයා ගත්තේය.

i. පිලිප්ස් වක්‍රයේ සෘණ බෑවුමට ඇති හේතු සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

ii. සංවර්ධනය වෙමින් පවතින රටක් විරැකියා අනුපාතය අවම කිරීම සඳහා මුදල් ප්‍රතිපත්තියේ වැදගත්කම පැහැදිලි කරන්න?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 06

පහත සඳහන් දේ පිළිබඳ කෙටි සටහන් ලියන්න

අ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI).

ආ. සංකෝචනය වන ආර්ථිකය.

ඇ. ස්වාභාවික විරැකියා අනුපාතය.

ඉ. LM වක්‍රය.

ඊ. මුදල් විශුද්ධිකරණය

(එක් කොටසකට ලකුණු 04 බැගින් )

(මුළු ලකුණු 20)